


## නොවැම්බර් 04 දා රසික ඔබට විවෘත වන අතුරු පසට චැට් එකක් Besen Center හිදී

ශ්‍රීනාත් මද්දුමගේ

මෑතක සිට මෙල්බර්න් පුරවරයේ වෙසෙන කලා රසිකයනට විවිධ නාට්‍ය දැක ගැනීමට අවස්ථාවක් උදා වී ඇත. මෙය ඉතා සුභදායී ප්‍රවණතාවක් බව අපට පෙනේ. මේ අවුරින් පිබිදෙන නාට්‍ය කලාවට උර දෙන කිහිප දෙනා අතරින් සම්භාවනීය නාට්‍ය රචකයකු නිශ්පාදකයක- හා රංග ශිල්පියෙකු වශයෙන් තරුණ නාට්‍යවේදී ගයාන් කණිෂ්ක හඳුන්වා දිය හැකිය. මෙතුවක් ගල් හිටි නාට්‍යායෙන් ඔබ ඇමතූ ඔහුගේ මුවට දීර්ඝ නාට්‍යය වන "අතුරු පසට චැට් එකක්" නාට්‍යයෙන් ඔබ හමුවට එන ගයාන් සමග සන්නස පිළිසඳරක යෙදෙයි.

ශ්‍රී ලංකාවේ සිටින ඉතා දක්ෂ ජනප්‍රිය නළු නිලියන් යොදා ගනිමින් කෙරෙන මේ දැවන්ත නිර්මාණය නැරඹීමට නොවැ. 04 දින සවස 6.00ට බීසන් සෙන්ටර් රඟහලට එක්වෙමු.

**කණිෂ්ක කොහොමද අලුත් නාට්‍යයේ වැඩක-ටයුතු?**

හැමදෙයක්ම හොඳින් කෙරීගෙන යනවා. කියන්න සතුටුයි සෑහෙන පිරිසක් ඉතා උද්යෝගයෙන් ඉන්නේ නාට්‍යය බලන්න. එවගේම මේ වනවිටත් සෑහෙන ප්‍රවේශ පත්‍ර ප්‍රමාණයක් විකිණිලත් අවසන්.

**පුහුණුවීම් කටයුතු සාර්ථකව කෙරෙනවද ?**

ඇත්තටම ඔව්... පසුගිය ජූනි මාසයේ තමයි මෙල්බර්න් වල ඉන්න පිරිසක් එක්ක අපි පුහුණුවීම් පටන් ගත්තේ. ඊට පස්සේ අගෝස්තු මාසයේම මම ලංකාවට ගිහිල්ලා ලංකාවෙන් නාට්‍යය සම්බන්ධ අයත් එක්ක පුහුණුවීම් කලා. ඒ වගේම ඒ කණ්ඩායම ඔක්තොම්බර් මුල් සතියෙ මෙල්බර්න්වලට එනවා. නැවතත් ඒ මාසයේම පූර්ණ කාලීනව පුහුණුවීම් කරලා තමයි නොවැම්බර් හතර අපි නාට්‍ය පෙන්නන්-න්.

**ඉතින් ඇයි මේ වගේ බැරෑරුම් කාර්යයකට අත තියන්න හිතුවේ.**

'අතුරුපසට කැ්ච් එකක්' නාට්‍ය පිටපත මම ලියන්න පටන් ගත්තෙ 2011 ජූනි මාසයේ. මේ පිටපත සඳහා මට සෑහෙන දුරකට පර්යේෂණ කරන්න උනා. ඒත් මේ පිටපතේ අවසානය දකින්න කියන නොයිවසිල්ල නිසාම මට ඒක ඉවරකරගන්න පුලුවන් උනා. මෙම පිටපත සඳහා මා තෝරාගී චරිත සමඟ මේ සම්බන්ධයෙන් කතාකලේ ඊට පස්සේ..... නාට්‍ය අවසාන රූපය ගැන ඉතා සුභවාදී දැක්මක් මගේ මනසේ ඇඳුනේ මෙයට සහභාගිවන ප්‍රවීන නලු නිලියන්ගේ එකතුවත් සමගයි. ඊට පස්සේ මෙහි තියන බැරෑරුම් කම යටකරගෙන හොඳ මට්ටමේ නාට්‍යයක අවසන් නිශ්පාදනයට අවශ්‍ය මානසිකත්වය ගොඩනැගුනා.

**නාට්‍යය සම්බන්ධ නලු නිලියන්ගේ ප්‍රතිචාරය කොහොමද නාට්‍ය ගැන ?**

මෙම සමස්ත වැඩකොටසෙහි මට ලැබුණ ප්‍රධානම අභිප්‍රේරනය තමයි ඒක. සහභාගිවන සියලුම නලු නිලියන් මේ පිටපතේ තියන වෙනසට කැමතියි. ඒ වගේම ඔවුන්ගේ රංගන හැකියාව ඉතා සියුම් ලෙස සහ තාත්විකව ප්‍රේක්ෂකයන් අතරට ගේන්න පුලුවන් පිටපතක් තියන එක ඔවුන් හැමෝම හිතනවා. එවගේම පුහුණුවීම් වලදී මට පේනවා ඒ හැම රංගනය ශිල්පියෙක්ම තමාට ලැබුණු චරිතයට ඉතා හොඳ සාධාරණයක් කරනවා කියලා. ඇත්තටම මේ නාට්‍යයේ අධ්‍යක්ෂක ලෙස මට ඒක ලොකු සතුටක්.

**මේ නාට්‍යයේ තියෙන විශේෂත්වය අපිට ටිකක් දැනගන්න පුලුවන්ද ?**

පිළිතුරු දෙන්න අපහසුම ප්‍රශ්නයක්... මට හිතෙනවා ඒක එදාට ප්‍රේක්ෂකාගාරයේ වාඩිවෙන ප්‍රේක්ෂකයන්ට කරන ආසාධාරණයක් කියාල. ඒකයි අපි හැමෝටම කියන්නේ 'හිස් අතින් හිස් ඔලුවෙන් ඇවිත් වාඩිගන්න කියලා'. ඔබ හිනාවෙන්න බලාගෙන නාට්‍ය බලන්න එනවානම් මේ නාට්‍යයේ ඔබට හිනා-වෙන්න සෑහෙන ඉඩක් වෙන්කරලා තියෙන්නේ.

හැබැයි නාට්‍ය පටන් ගන්න වෙලේ ඉඳන් කියන කියන වචනයට හිනාවෙන්න බලාගෙන මේ නාට්‍ය බලන්න එන එක තේරුමක් නෑ. අනෙක් විශේෂ කාරණය තමයි ඔබ හිනාවුනේ මොනවටද කියලා දෙපාරක් හිතන්න මේ නාට්‍යයේ ඉඩ වෙන් කරලා තියනවා.

මෙම නාට්‍ය දිවෙන නාට්‍ය ආකෘතිය ඔබ හැමෝටම අලුත් අත්දැකීමක් මෙම විශ්වාස කරනවා බොහෝමයක් ප්‍රේක්ෂකයින් ඒකට කැමති වෙයි. ඒවගේම නාට්‍ය රසවින්දනයේ වෙනත් පැත්තකට ඔබ ඔබව පුහුණුකරගැනීමක් විදියට ඒක හඳුන්වන්නත් පුලුවන්.

**මෙම නාට්‍යයේ නිශ්පාදක කණ්ඩායම මතක් කරනවානම්**

ඔව්..... මේ නාට්‍යට රංගන දායකත්වය ලබාදෙනවා මහේන්ද්‍ර පෙරේරා, දුලීකා මාරපන, ජගත් චමිල, අයෝමි ශානිකා, ශ්‍රීනාත් මද්දුමගේ, භානුක මනෝරත්න සමග නෙලුම් අමුණුගම. සංගීත නිර්මාණය තිසර බණ්ඩාර, ආලෝකකරණය සුජිත් බණ්ඩාර, වේෂ නිරූපනය ලෙලනි ධර්මරත්න ඇඳුම් නිර්මාණය ඉරේෂා මනතුංග වේදිකා කළමණාකරණය දිල්කි ජයතිලක, චතුරු සිරිවර්ධන, දිල්හාන් ජයතිලක, පාරමී සිරිවර්ධන. නිශ්පාදන කළමණාකරණය ජේෂප් සූටින් මයාදුන්නේ සහ දිලාන් ජයතිලක විසින්ද සිදුකරනු ලබනවා.

**ඒ වගේම මෙම නාට්‍යයේ නිශ්පාදන දායකත්වය ගැන මතක් කලොත්**

"අතිමාරියල් සහ ඔස්ටියාස් පෞද්ගලික ආයතන දෙක තමයි මෙයට නිශ්පාදන දායකත්වය ලබාදෙන්නේ. ඒ වගේම මේක "බසප්‍රැක ඔයැ්එරු ඨ්බට එකේ පලවෙනි නිශ්පාදනය. එවගේම අපි බලාපොරොත්තු වෙනවා "බසප්‍රැක ඔයැ්එරු ඨ්බට එකෙන් දිගටම නාට්‍ය නිශ්පාදනය කරන්න.

**අවසාන වශයෙන් ප්‍රේක්ෂකයින්ට මොකද්ද කියන්න තියෙන්නේ මොකද දැන් ඔබමනේ කියන්නේ 'හිස් අතින් හිස් ඔලුවෙන් ඇවිත් වාඩිගන්න කියලා'**

"(සිනාසී) ඔබේ සිතේ තියෙන තෙතමනය විතරක් රැගෙන නොවැම්බර් හතරවෙනිදා ඊෑබ ඤබඑර එකට ඇවිල්ලා මේ නාට්‍යය බලන්න. ඊට පස්සේ නාට්‍ය සම්බන්ධයෙන් ඔබගේ අවංක ප්‍රතිචාරය, ගුණදොස් එදාටම ලබාගන්න අපි වැඩපිළිවෙලක් සකස් කරලා තියෙනවා. එතනදී දෙන ඔබේ විචාරය අපේ ඉදිරි නිර්මාණවලට සෑහෙන්න රුකුලක් වේවි.


*"I am the vine you are the branches. Those who abide in me and I in them bare much fruit, because apart from me you can do nothing". (Jn 15:5)*



Rev. Fr. Darrel Coonghe



Rev. Sr. Selinta Fernando

**You are invited to come and pray with Fr. Darrel Coonghe, Director of Good News Catholic Ashram Sri Lanka, who holds a Powerful Healing Ministry with the gift of preaching the Word of God. Lots of Healings, Miracles & Conversions are reported in the Retreats conducted by him. He is accompanied by Rev. Sr. Selinta Fernando who assists with his ministry.**

| Date | Time | Venue |
|---|---|---|
| 19th October 2012 Friday | 7.00pm Holy mass followed by the C.R.L Prayer Meeting & Benediction (English) | Sacred Heart Church, 4, Winifred Street, St. Albans |
| 21st October 2012 Sunday | 10.30am Holy Mass followed by Lunch at 12pm Programme (Sinhalese) 1.00 pm – 4.00pm | All Nations Marian Centre, (Ta-Pinu)15, Flangans Drive, Merimimu, Bacchus, Marsh |
| 22nd October 2012 Monday | 7.00pm - 9.30pm Holy Mass and programme (English) | Our Lady of Perpetual Help Church<br>2 Wilana, St, Ringwood |
| 25th October 2012 Thursday | 7.00pm – 9.30pm Holy Mass and Adoration (English) | St Peter's Church,<br>13, Davisson Street, Epping |
| 26th October 2012 Friday | 7.00pm Holy mass followed by the C.R.L Prayer Meeting & Benediction (English) | Sacred Heart Church, 4, Winifred Street, St. Albans |
| 27th October 2012 Saturday | 10.00am to 5.00pm<br>Day Retreat (English) (BYO Lunch) | St. John Vienney Hall<br>23, Police Road, Mulgrave |

*Organised by Australia Sri Lanka Catholic Association*
*For further information please contact;*
*Rukmal or Kumudu - 0411 468 571 / 9449 0021*
*Suresh or Geetha - 0410 453 818 / 9763 4649*